පිනසේන පසු කාලයේ ජීවත්වීම උදෙසා අතට අසුවන කුලී වැඩ වැනි රැකියාවන් සඳහා යොමු වූයේය. පසුව බිරිඳ සමඟ එකතු වී කඩයප්පන් තනා අහළ පහළ නිවෙස්වලට මෙන්ම ගමේ හෝටල්වලටද සැපයූවේය. එහෙත් බිරිඳගේ හදිසි අසනීපවීමත් සමඟ ඔහු අසරණ විය. පත්වන අළුත් රජයක් යටතේ වන්දි මුදල් සමඟ රැකියාව ලබා ගැනීමට සිහින ගොන්නක් මවාගෙන සිටි පිනසේන මාමා ඒ සිහින සමඟ ජීවිතය දියකර පවතින රජය කාලයේම හෘදයාබාධයකින් මරු වැළඳගත්තේය.

කළු ජූලියද අප වයසේ කාටත් මතක ඇති අමතක නොවන ජූලියකි. මා සියැසින් දුටු අළුදූලි ගිනිදැල් මැවූ කළු ජූලියේ අඳුරු වළාකුළු තාමත් අප සිත් සතන් අතර තෙරපී ඉකි බිඳින්නේ එවැනි දිනක් නැවත එනතුරු බලා සිටින නොයෙක් බලවේග බිහි වෙමින් පවතින වකවානුවකය. එනිසා එම කළු අතීතය නැවත නැවත මතක් කරමින් වෛරය, ක්‍රෝධය මිනිස් සිත් තුළින් පළවා හැරීම අපගේ යුතුකමක් මෙන්ම අද දවසේ වැදගත් කාර්යභාරයකි.

පහත ඇත්තේ කළු ජූලිය සම්බන්ධයෙන් මගේ එක් මතකයකි. එකළ මා රැකියාව කළේ පෑලියගොඩ ප්‍රදේශයේ මුද්‍රණ සමාග මකය. එදින එවැනි තත්වයක් රටපුරා ඇතිවී ඇති බැව් මා දැනගත්තේ කටකතා හා අහස් තලයට ඇදී යන කළු දුම්රොටු නිසාය. එදා පැවති රජය එම මළ ජූලියට රිසි සේ ගලායන්නට ඉඩ හැරියේ උතුරේ ප්‍රචණ්ඩ පිරිස් එයින් හෝ ආම්බාන් වේ යැයි සිතාය.රජයේ හමුදාව යොදවා මර්ධනය කර ජාත්‍යන්තරය නොරොක් කරගන්නවාට වඩා,මැර ජනතාවට වැඩේ බාර දී අත පිසදා ගැනීමටය. මෙය බොහෝ අම්හිරි සිද්ධීන් අතර එක් සිද්ධියක් පමණි. එදින පිටකොටුවෙන් බඩු භාණ්ඩ රැගෙන නුවරඑළිය බලා යන ලොරි රථයකට පෑලියගොඩ හංදියේදී, මැරයන් ගිනි තැබුවේ එහි රියදුරු අමු අමුවේ පුළුස්සා දමමිනි. එහි ලොරි සහායකයා පලා ගියද ඔහු පසු පස හඹා ගිය මැරයන් ඔහුට කුමක් කළේදැයි යන්න අදවන තුරු කිසිවකුත් දන්නේ නැත. එයින් තත්පර කිහිපයකදී කඩු, පොලු, මුගුරු රැගත් තවත් මැරයන් පිරිසක් කුරණෑගල ප්‍රදේශයට ධාවනය වන හාල්, පිටි, පරිප්පු, කිරි පැකට් ආදී බඩු පුරවාගත් ලොකු ලොරියක් නතර කළේ අප දෑස් ඉදිරිපිටදීය. රථ සහායකයා හා රියදුරු අපි දෙමළ නෙමෙයි සිංහල සිංහල කියා කෑගැසුවේ බියෙන් භ්‍රාන්තවය. ඔවුන්ගේ සිංහල භාෂාවේ දැනුම හා කථනය පරීක්ෂා කරන්නට මැරයන් දෙතුන් දෙනෙකු ඔවුන් දෙදෙනා වට කරගත් අතර සෙසු පිරිස ලොරියේ සියළුම ආහාර ද්‍රව්‍ය මංකොල්ල කෑවේ ඉතාමත් සුළු කාලයකිනි. ජාතිය සිංහල වුවත් ඔවුන් ලොරියද අතහැර ජීවිතය බේරාගෙන පලාගිය අන්දම මා දෑසේ තවමත් සටහන් වී ඇත.

එම මංකොල්ලකරුවන්, මැර පිරිස් සියල්ල තොටළඟ පෑලියගොඩ අවට ජීවත්වන බව මා දැනගත්තේ මා සමඟ මේ සියල්ල දෑසින් දුටු ප්‍රදේශයේම තවත් පුද්ගලයෙකුගෙනි. ඒ අතර දෙමළ නම් ඇති පුද්ගලයන් දෙතුන් දෙනෙකුද ඇති බැව් අපට වැටහුණේ ඔවුන් එකිනෙකාට ආමන්ත්‍රණය කළ නම් නිසාය. එහෙත් ඔවුන් සංවිධානාත්මකව මෙහෙ යවන්නට මැර නායකයකු දෙදෙනෙකුද ඒ අතර සිටියහ.

ඇත්තෙන්ම කළු ජූලියේ ජාත්‍යාලය තුළින් එළියට පැන්නේ, වෛරය, ක්‍රෝධය හා මුසුව විවෘත ආර්ථිකය තුළින් එල නෙලාගන්නට නොහැකි වූ දරිද්‍රතාවයෙන් පෙළෙනු ජන කොටසකගේ ආවේගය හා ප්‍රචණ්ඩත්වයයි. එවැනි පීඩිතයන් තමන්ට කිසිදා ලබාගත නොහැකි භෞතික සම්පත් දෑ බලෙන් හෝ ලබාගෙන භුක්ති විඳීමට මාන බැලූහ. පිටරට ඇපල්, මිදි, දොඩම්, චීස්, බටර්, මහපාරේ රූපවාහිනී තිරය තුළින් දුටු දකුණේ පීඩිතයා,ඒවා සැබැවින්ම භුක්ති විඳීමට යොදා ගත් එක් මරු කපොල්ලක් වන්නේ කළු ජූලියයි. මේ මළ ජූලියෙන් මෙන්ම, අසූ අට අසූ නවය භීෂණය හා උතුරු දකුණු යුද්ධයේදී අහිමි වූ ජීවිත පිළිබඳව අද වනතුරු වගකිව යුත්තන් කිසි වකු නැත. මෙම ජීවිත සියල්ල රටට අහිමිව ගියේ ඇයිද යන්න කතිකාවක් අදටත් ගොඩ නැගී නැත. සිදුව ඇත්තේ, එම අහිමිව ගිය ජීවිතවලින් බලයට ආ දේශපාලුවන්ගේ හොද්ද බොරවීම පමණි.

කළු ජූලිය සමඟින් මුහුණ දෙන්නට සිදුවූ තිස් අවුරුදු යුද්ධය සේම ඒ හා බැඳි අප වැනි රටකට ඔරොත්තු නොදෙන තරමට ගලා ගිය මහා පරිමාණයේ වංචා අල්ලස් දූෂණ නිසා යාන්තම් හෝ එගොඩ වන්නටත් නොහැකි අනාගතයකට අද අපි මුහුණ දී සිටිමු. අද අප රට අඳුරේ අතපත ගාන හැටි දකින විට, ජූලි මාසය පමණක් නොව අනෙක් මාස එකොළහම අපිට කළු මාස වී ඇත. විප්‍රවාසීන් ලෙසින් මෙවැනි රටක ජීවත්වන අපේ පෑනෙන් මව් රට ගැන මෙතරම්ම ලියවෙන්නේ ඒ දුක් කඳුළු බර හංගාගන්නට බැරි නිසාය.තවමත් ගොඩගන්නට හැකි බැව් විශ්වාස කරන නිසාය. එහෙයින් අනාගතය ගැන සිතන්නට බොහෝ දේ ඉතිරි කර මව් රට තවමත් හුස්ම ගනිමින් ජනතාව දෙස බලා සිටී.






**සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.**

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au

